**ශීර්ෂය 119 - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 119 - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 13,667.34 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 13,020.26 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 647.08 ක් හෙවත් සියයට 4.73 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 508.64 | 476.60 | 32.04 | 6.30 |
| මූලධන | 13,158.70 | 12,543.66 | 615.04 | 4.67 |
| එකතුව | 13,667.34 | 13,020.26 | 647.08 | 4.73 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 11901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.00 | 6.10 | 2.40 | 3.15 | 15.00 | 10.08 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0038/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 22.18 ක් විය.මෙය අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ කුලී තැන්පතුව වන අතර ගිවිසුම් කාලය අවසාන වන විට නිරවුල් විමට නියමිතව ඇත.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 4.19 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0112/000 | 3.38 |
| 6000/0000/00/0013/0122/000 | 0.81 |
| එකතුව | 4.19 |

## 2.5 විගණන නිරීක්ෂණය

----------------------

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 3.1 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

වැය විෂයයක් සඳහා රු.මිලියන 96.00 ක අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී මුදල් රෙගුලාසි 66 ප්‍රකාර රු.මිලියන 18.28 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. ඒ අනුව වු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 59.92 ක් උපයෝජනය කල පසු ඉතිරිය රු. මිලියන 17.79 ක් වී තිබුණි. මේ අනුව සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදන සියයට 22.90 ක් ඉතිරි වී තිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

අමාත්‍ය කාර්යාලය සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 බැරකම්වලට එළඹීම

-------------------------

සමාලෝචිත වර්ෂයේ දී මුදල් රෙගුලාසි 94(1) විධිවිධානයට පටහැනිව වැය විෂයයන් 17 ක් වෙනුවෙන් සලසා තිබු ප්‍රතිපාදනය රු. 4,207,198 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

## 3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

(අ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාලයීය රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 3.1 ඡේදයට අනුකූල නොවන පරිදි අමාත්‍යවරයා සඳහා වාහන 04 ක් වෙන් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 2.1 ඡේදයෙන් බැහැරව අමාත්‍යවරයා සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව තවත් නිලධාරීන් 05 ක් යොදවා තිබුණි.

**3.5** **විදේශාධාර ව්‍යාපෘති**

----------------------

(අ) **විදේශාධාර උපයෝජනය**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** **පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

--------------------------------------------------------------------------------

විශ්වවිද්‍යාල 04 ක සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා පියස මත සූර්ය බලාගාර සවි කිරීම සඳහා රු. මිලියන 100 ක් ඇස්තමේන්තු කර තිබූ අතර වැසි සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් පෞද්ගලික ආයතනවල සූර්ය බලාගාර සවිකිරීම 2016 වර්ෂයේදී සිදු නොකිරීම නිසා රු.මිලියන 34.95 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ii)** **තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘතිය**

----------------------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 31.20 ක් වූ මෙම ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුකළ වෙනස්කම් හේතුවෙන් සැලසුම් කළ පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.15,148,881 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 49 ක් ඉතිරිව පැවතුණි.

**(ආ)** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** **පිවිතුරු බලශක්ති ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම**

----------------------------------------------------

ශ්‍රී ජයවර්ධනපුර පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.මිලියන 2,863.3 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර එය 2014 වර්ෂයේ ආරම්භ කර 2016 දෙසැම්බර් නිම කළ යුතුව තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට එයින් වැය වී ඇති මුදල රු.මිලියන 2,807 ක් වූ අතර එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 69 ක් පමණක් විය.

**(ii)** **තිරසාර විදුලිබල අංශ සහාය ව්‍යාපෘතිය**

--------------------------------------------

කිරිබත්කුඹුර ජාල උපපොළ වර්ධනය කිරීම සඳහා 2015 වර්ෂයේ රු.මිලියන 1,042 ක් ඇස්තමේන්තු කර තිබූ අතර මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ නිම කළ යුතුව තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට මේ වෙනුවෙන් වැය කර තිබූ මුදල රු.මිලියන 831 ක් වූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 67 ක් විය.

**3.6** **පාඩු හා හානි**

---------------

මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 10 කදී අමාත්‍යාංශයේ වාහන අනතුරු සම්බන්ධයෙන් රු. 838,045 ක අලාභයක් 2017 අගෝස්තු 15 දින දක්වාම අදාල පාර්ශවකරුවන්ගෙන් අයකරගෙන නොතිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වූ කැබ් රථයක් හා යතුරු පැදියක් අස්ථාන ගත වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදු කර තිබුණි. 2016 මාර්තු 01 දිනැති අංක C 04 – 13 – CR දරන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව කැබ් රථය අබලි තත්ත්වයෙන් වාරියපොළ විදුලි ඉංජිනේරු විසින් වෙන්දේසියේ විකුණා ඇති බවත් යතුරු පැදිය දිරාපත්ව ඇති බවත් ඒ අනුව අපරාධ චෝදනාවන් ගොනු කිරීමට ප්‍රමාණවත් කරුණු නොමැති බවත් සඳහන් කර විමර්ශනය අවසන් කර තිබුණි. කෙසේ වුවද එම වාහනවල අයිතිය තවදුරටත් අමාත්‍යාංශය නමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ මුද්‍රා ප්‍රකාශනවල අමාත්‍යාංශ නියෝග මත දරන ලද අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 12,742,305 ක ශේෂයක් වසර 4 කට වැඩි කාලයක සිට අය නොවී පවත්නා බව දැක්වුණ ද මෙම ශේෂය නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවකවර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 14 | 05 | |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | |
| (iii) | ද්විතියික මට්ටම | 72 | 51 | 21 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 46 | 33 | 13 | |
| (v) | වෙනත් - අනියම් | - | 10 | - | 09 |
| | - කොන්ත්‍රාත් | - | 02 | - | 02 |
| | එකතුව | 141 | 111 | 42 | 11 |

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| i. | විදුලි ඉංජිනේරු | 1 | | 2008-02-08 දින සිට |
| ii. | පාලන සම්බන්ධීකාරක | 2 | | 2015-05-18 දින හා<br>2015-10-21 දින සිට |
| iii. | යතුරු ලේඛිකා | 2 | | 2010-11-18 දින හා<br>2015-11-27 දින සිට |
| iv. | ලිපිකරු | 2 | | 2013-01-16 දින හා<br>2014-03-05 දින සිට |
| v. | පුහුණුවන කණිෂ්ඨ කාර්මික සහයක | 1 | | 2015-11-02 දින සිට |
| vi. | කාර්යාල සේවක | 3 | ලංකා විදුලිබල මණ්ඩලය | 2011-05-06 දින හා<br>2011-08-22 දින සිට |
| vii. | රියදුරු | 1 | | 2011-08-22 දින සිට |
| viii. | වෙබ් නිර්මාණකරු (මිනිස් බල ) | 1 | | 2015-03-19 දින සිට |
| ix. | වීඩියෝ කැමරා සහායක (මිනිස් බල ) | 1 | | 2015-03-19 දින සිට |
| x. | රියදුරු | 1 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 2015-09-10 දින සිට |
| xi. | රියදුරු | 1 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2015-11-23 දින සිට |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාලීය රජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිළධාරියෙකු අනුයුක්ත කරගන්නේ නම් ඔහුට ගෙවිය යුත්තේ ඔහු එම ආයතනයේ ලබමින් සිටිය වැටුප නොව අනුයුක්ත කරන ලද තනතුරට අදාල වැටුප් වේ . නමුත් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති බාහිර ආයතන වල නිලධාරීන්ට ඔවුන් සේවය කළ ආයතනයේ ලබමින් සිටි වැටුප් ගෙවා තිබුණි.

(ii) අමාත්‍යාංශයේ සේවයේ යෙදවූ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයන් 14 දෙනෙකු සඳහා හා ශ්‍රී ලංකා මහ බැංකුවේ රියදුරෙකු සඳහා වැටුප් පිළිවෙලින් රු. 15,754,889 ක් හා රු. 2,215,572 ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබූ අතර සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිළධාරියා වෙනුවෙන් රු. 948,528 ක වැටුප් එම අධිකාරිය විසින් ගෙවා තිබුණි.